ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 40 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු.3.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

**2000 අංක 40 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 03 වන දින.]

එල්. ඩී. —ඕ. 10/98

**1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2000 අංක 40 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ 6 වන වගන්තියේ "විකාශය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 52 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"පරිගණකය" යන්නෙන්, තොරතුරු ගබඩා කිරීමට හා සැකසුම් කිරීමට හැකියාව ඇති විද්‍යුත් හෝ වෙනත් උපකරණයක් අදහස් වේ ;

"පරිගණක ක්‍රමලේඛය" යන්නෙන්, පරිගණකයකට කියවිය හැකි මාධ්‍යයකින් අන්තර්ගත කළ විට, විශේෂ කටයුත්තක් ඉටු කිරීමට හෝ විශේෂ ප්‍රතිඵලයක් ලබා ගැනීමට පරිගණකයට හැකියාව සලසන වචන, කේත, ක්‍රම හෝ වෙනත් යම් ආකාරයක උපදේශ මාලාවක් අදහස් වේ.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඒ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඒ) භූගෝල විද්‍යාවට, භූ ලක්ෂණ විද්‍යාවට, ගෘහ නිර්මාණ ශිල්පයට හෝ විද්‍යාවට අදාළ පැහැදිලි කිරීම්, සිතියම්, පිඹුරු, කටු සටහන් හා ත්‍රිමාණ කෘති ;

(ඔ) පරිගණක ක්‍රමලේඛ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) යම් ලකුණක් ලියාපදිංචි කිරීමට යෙදුනේ කවර භාණ්ඩ සඳහා ද (එම භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ විකිණීම සඳහා හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සඳහා අදහස් කරන ලද්දේ වුව ද) ඒ භාණ්ඩ පිළිබඳව හෝ ඒවා සම්බන්ධයෙන් මහජනයා නොමග යැවීමට තුඩු දෙන ආකාරයෙන් එම ලකුණට සමාන වූ ලකුණක් හෝ ලාංඡනයක් තුන්වන පාර්ශ්වයක් විසින් (මුද්‍රණය කිරීමෙන්, පින්තාරු කිරීමෙන් හෝ අන්‍යාකාර මාර්ගයකින්) ශ්‍රී ලංකාව තුළ යොදා ගැනීම හෝ ඇලවීම (2) වන උපවගන්තිය යටතේ තහනම් කරනු ලැබූ ක්‍රියාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.